# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 481/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 19/03/2024<br>පැය 0955 |

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - මොරටුමුල්ල පොලිස් වසම.**

2024.03.18 වන දින උදෑසන කාලයේ මොරටුමුල්ල පොලිස් වසමේ පහළ ඉදිබැද්ද ප්‍රදේශයේ නිවසක කාන්තාවක් තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කර ඇති බවට මොරටුමුල්ල පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.
**මරණකාරිය වයස අවුරුදු 50 ක් වන පහළ ඉදිබැද්ද, මොරටුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ඝාතනයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදු කර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා පානදුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇති අතර මොරටුමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පුලියන්කුලම පොලිස් ස්ථානය.**

2024.03.18 වන දින සවස් කාලයේ පුලියන්කුලම පොලිස් වසමේ පුදුර් හන්දියේදී පුලියන්කුලම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවි 02 ක්** සමග සැකකරුවෙකු අත් අඩංගුවට ගෙන ඇත.

**අත් අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන පුලියන්කුලම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පුලියන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - කෑගල්ල පොලිස් වසම.

2024.03.18 වන දින උදෑසන කාලයේ කෑගල්ල පොලිස් වසමේ කෑගල්ල හෙට්ටිමුල්ල මාර්ගයේ වල්දෙනිය පාරට හැරෙන හන්දිය අසලදී කෑගල්ල දෙස සිට බුලත්කොහුපිටිය දෙසට ධාවනය වූ වෑන් රථයක මාර්ගය හරහා ගමන්කළ පදික කාන්තාවක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව ප්‍රතිකාර සඳහා කෑගල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 64 ක් වූ පිටිහුම, කෑගල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය කෑගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, අනතුර සම්බන්ධයෙන් වෑන් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කෑගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**